# කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ අමාත්‍ය

# ගරු ආර්. එම් ධර්මදාස බණ්ඩා මැතිතුමන් සමග කරනු ලැබූ සාකච්ඡාව

**ප්‍රශ්නය:-**

ගරු ඇමතිතුමණි. ඔබ තුමා දැනට ප්‍රකාශ කරල තියෙනවා; සහල් ඇතුළු ආහාර ද්‍රව්‍ය කිහිපයක් පිට රටින් ගෙන්වීම නතර කරන බව. අපට ආධාර කරන ජාත්‍යන්තර ආයතන කියනවා ආනයන සීමා කිරීමෙන් වලකින්න කියලා. ඇමතිතුමනි, භාණ්ඩ ආනයනය තහනම් කිරීම සහ රජයේ නිදහස් ආර්ථික ප්‍රතිපත්ති අතර ගැටුමක් ඇති වෙන්න පුළුවන් නේද ?

**පිළිතුර :-**

මම හිතන්නේ නැහැ; මෙතන ගැටුමක් ඇති වෙයි කියලා . ලෝක බැංකුව හරි වෙනත් ආයතන හරි කියලා නැහැ පූර්ණ නිදහස් ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න කියලවත් , පිටරටින් බඩු ගෙනල්ල මෙහෙ වෙළඳ පොල පුරවන්න කියලවත්. ඒක අපේ රජය විසින් ගන්න ඕන තීරණයක්. අපට අපේ නිෂ්පාදන ශක්තිය වැඩි කරන්න ඕනෑම උපක්‍රමයක් යොදන්න පුළුවන් ඒකට ඒ ගොල්ලන්ට ඇඟිලි ගහන්න බැහැ. මේ නිසා නිදහස් ආර්ථික ක්‍රමයයි අපේ ආහාර නිෂ්පාදන යයි අතර ගැටුමක් ඇති වෙන්නෙ නැහැ. දැනටමත් අපි කියලා තියෙනවා පිටරටින් ගෙන්වන එක නවත්වනව කියල. මොකක් ද ඒකට තියෙන බාධකය ? අනික් පැත්තට අපි හිතමු; නිදහස් ආර්ථික ක්‍රමයෙන් ඉඩ දුන්නොත්, හාල් නිෂ්පාදනය කරන වෙනත් රට වලින් ගෙනල්ල මෙහෙ අලෙවි කරන්න. රු. 10/= කට විතර එතකොට පුළුවන් පිටරට මිනිසුන්ට අපේ වී නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම විනාශ කරන්න. අපි ඒකට ඉඩ දෙන්නෙ, නැහැ. අපට අවශ්‍ය වෙන්නෙ රට ඇතුලෙ තරඟයක් පවත්වා ගන්න. ජාත්‍යන්තර වෙළඳ පොලේ තරඟ කරන්න අපිට අවශ්‍ය නැහැ.

**ප්‍රශ්නය :-**

නිදහස් ආර්ථිකය තුළ තරඟකාරී වශයෙන් වැඩි ලාභ තියෙන දේ නිෂ්පාදනය කරල, ඒවා පිට රටට අපනයනය කරල; මෙහෙ නිපදවන්න වැඩි වියදමක් යන භාණ්ඩ පිටරටින් ගෙන්වන්න කියල, අපට ජාත්‍යන්තර ණය දෙන ආයතන කියලා තියෙනවා නේද ?

**පිළිතුර :-**

ඔව්, අපිට විතරක් නොවෙයි ඕනෑම රටකට ඒ ගොල්ලන්ට එහෙම කියන්න පුළුවන්. ඒක ආර්ථික ප්‍රතිපත්තියක්. දැන් මෙහෙ තිබෙන ලාභදායි දේවල් පිටරට යවනවා. එතකොට අපිට නිපදවන්න පාඩු දේවල් පිටරටින් ගෙන්වන්න කියලානෙ තියෙන්නෙ. මට හිතෙන්නෙ නම්, කෘෂිකර්මයේ දී ඒ ආර්ථික ප්‍රතිපත්තිය අපට අනුගමනය කරන්න බැහැ ඒ ගොල්ලො එහෙම කීවට මොකද? අපි මෙහෙ විශාල මුදලක් වියදම් කරලා, කුඹුරු අස්වද්දල තියෙනවා. වී නිෂ්පාදනය කරන්නෙ අපි පිටරට යවන්න බලාගෙන නෙවෙයි. අපේම පරිභෝජනයට. ඉතින් අපේ පරිභෝජනයට නිපදවන දේවල් පිටරට ලාබෙට තියෙනවයි කියල මෙහෙ ගෙන්නල දාල පුලුවන්ද අපේ කුඹුරු පුරන් කරන්න? එතකොට මොකද්ද අපි මෙච්චර කල් කෝටි ගානක් වියදම් කරල කරපු දේ. මම හිතන හැටියට ලෝක බැංකුවෙන් එහෙම තහංචියක් නැහැ.

**ප්‍රශ්නය :-**

ගරු ඇමති තුමනි, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වෙළඳ අමාත්‍යාංශයත් සමග යම් යම් ප්‍රශ්ණ මතු වෙනවා නේ ද? උදාහරණයක් තමයි පසුගිය කාලේ ලොකු ළූණු ආනයනය කිරීම.

**පිළිතුර :-**

අන්න ඒක තමයි, විවෘත ආර්ථිකයේ තියෙන දූර්වල තැන්. අපි සමහර අයට බලපත්‍ර දෙනවා අහවල් දවසට ඉස්සර ගේන්න කියලා, නමුත් වෙළෙන්දා කුට වැඩ කරනවා. කුට වැඩ කරනවයි කියන්නෙ නැව අබලන් වුනා, නැව වෙලාවට ආවේ නැහැ, කියලා සුමාන ගණන් පහු කරනවා. මොකද ඒ ගොල්ලො දන්නවා අපේ තහංචිය නිසා පහු වෙලා ආවොත් විශාල මුදලකට ඒවා විකුණ ගන්න පුළුවන් කියලා. නැව හිතාමතාම ප්‍රමාද කරනවා. එහෙම කරලා අපිට කියනවා නැව කැඩුනයි කියලා. අපෙත් ඉන්නවනෙ ඒ ගොල්ලන්ට උදව් කරන සමහර නිලධාරීන් ඒක පිළිගන්නව.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමනි, හුඟාක් වෙලාවට ලොකු ළූණු ගොවීන් කියන දෙයක් තමයි, ගබඩා කරන්න අකමැති, රජය අනුගමනය කරන ප්‍රතිපත්ති වල පැහැදිලි කමක් නැති නිසා කියලා. ගොවීන් කියනවා හිටපු ගමන් සමහර වෙලාවට රජය පිටරටින් ළූණු ගෙන්වනවා කියලා.

**පිළිතුර :-**

එහි කිසිම සත්‍යතාවයක් නැහැ. දැන් ළඟදී තිබුනා රැස්වීමක් දඹුල්ලෙ. ගොවීන් සූදානම්, ඒ ගොල්ලන්ගේ අස්වැන්න ගබඩා කරන්න.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමනි, දැනට ගබඩා කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කරලා තියෙනවද?

**පිළිතුර :-**

ඔව්., ඔක්කොම ගොවීන්ට ගබඩා කරන්න බැහැ. විශේෂයෙන්ම පොඩි ඉඩම් කැබැල්ලක් වගා කරන මනුස්සයෙකුට ඒක කරන්න අපහසුයි මොකද ? ඒ මනුස්සයට ලැබෙන්නෙ සමහර විට කිලෝ 200 ක් 300 ක් විතර. ඉතින් ඒක ගබඩා කර දෙන්න බැහැනෙ. ඒක හින්ද ඔහු ඒක ඉක්මණට අලෙවි කරනවා. නමුත්, කිලෝ 5000 ක් 10,000 ක් තියෙන ගොවියා 5000 ක් විතර හෙමින් හෙමින් අලෙවි කරලා ඉතිරි 5000 ක් තමයි ගබඩා කරන්නෙ. අපි බලාපොරොත්තු වෙනවා නම් එයා 10,000 ම ගබඩා කරාවි කියලා ඒක වැරදියි. මොකද ඒ මනුස්සයටත් සල්ලිනෙ ඕන. ණය තුරුස් බේරන්න ඕන. අනිත් එක ළූණු ගැලෙව්වම ඒව ගැලෙව්ව කියලා ආරංචි වුනහම බැංකුවත් යනවා. ණය කාරයත් යනවා, කඩ කාරයත් යනව, නෑදෑයොත් යනවා තමන්ගෙ සල්ලි ගන්න. ඉතින් ඒ මිනිහට යම් ප්‍රමාණයක් කීයකට හරි විකුණන්න වෙනවා. හැබැයි පිටරටින් ළූණු එනවයි කියලා නම් බය වෙන්න දෙයක් නැහැ. සමහර අය; අපට විරුද්ධ අය ප්‍රචාරය කරනවා පිටරටින් ළූණු ගෙන්වනවා කියලා. ඒ වුනාට අපේ නියම ගොවීන් දන්නවා අපි එහෙම කරන්නෙ නැහැයි කියලා. මොකද ? අපි දැනට ප්‍රසිද්ධියේ ම කියලා තියෙනවා ගෙන්වන්නෙ නැහැ කියලා. දැන් සිද්ධ වෙලා තියෙන්නෙ අර නැව් දෙකක් ප්‍රමාද වෙලා ආපු එකේ ගැටලුව ඒකට හේතු ඇහැව්වම අපිට කීවේ යාන්ත්‍රික දෝෂයක් කියලා . අනිත් අතට ඒ විෂයය තියෙන්නෙත් මගේ පාලනය යටතේ නොවෙයි

**ප්‍රශ්නය :-**

ඇමතිතුමනි, ඔබ ප්‍රකාශ කලා සමහර කෘෂි භෝග ආනයනය කිරීම නවත්වනවා කියලා . දැන් අපි හිතමු හාල්, යම් කිසි අවුරුද්දකින් පසු ගෙන්වන්නෙ නැහැ කියලා. ළූණු යම් කිසි අවුරුද්දකින් පසු ගෙන්වන්නෙ නැහැ කියලා. ඒවාගේ කෘෂි භෝග පිළිබද ප්‍රතිපත්ති ඉතාමත් වැදගත් ගොවියාට. අපි

කොහොමද? කෘෂිකර්ම අමාත්‍යාංශය වශයෙන් ඒ ඉලක්ක කරා ළඟා වෙන්නෙ. ඒ ඉලක්ක කරා ළඟා වීමට ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙල මොකක්ද ?

**පිළිතුර**

අපි මෙතෙක් කල් බොහොම මහන්සි උනා මේවායින් ස්වයංපෝෂිත භාවය ළඟා කර ගන්න තවම අපට බැරි වුනා. නමුත් අපි කොහොම හරි ස්වයංපෝෂිත භාවය ලබන්න ඕන. ඉතින් මම ඒකට එක උපක්‍රමයක් හැදුවා. ඒ කියන්නෙ ආනයනය නැවැත්වීම. 95 ජනවාරියෙ ඉඳලා අපි හාල් පිට රටින් ගෙන්වන්නෙ නැහැ. ඒක රටටම ප්‍රකාශ කළා. මිරිස් ගෙන්වන්නෙත් නැහැ ළූණු ගෙන්වන්නෙත් නැහැ. අපි මුලින්ම ඒ ටික ගමු. දැන් එතකොට, මුහුණ දෙන්න වෙන ඊළඟ ප්‍රශ්නෙ තමා රජයත්, මැති ඇමතිවරුන් නිලධාරීනුත් විශාල යුද්ධයක් කරන්න මෙහෙය වන්න ඕන. මොකද? අපි කවුරුත් පිළිගන්නවනෙ පිටරටින් ගේන එක නවත්වන එක හොඳයි කියලා. එහෙම නවත්වන්නෙ නැත්නම් අපි ඒ ඉලක්කයට ළඟා වෙන්නෙ ඕනෑ. අපිට අවශ්‍ය දේවල් නිෂ්පාදනය කරලා. ඒ නිෂ්පාදනය ළඟා කර ගන්න වැඩ පිළිවෙල අපි දැන් සීඝ්‍රයෙන් කර ගෙන යනවා. ඒකට අපිට අවශ්‍ය දේවල් සකස් කර ගන්න වෙනවා නිලධාරීන්ගේ අඩුවක් තියෙනවා නම්, අවශ්‍ය නිලධාරීන් පත් කරගන්න ඕන. දැන් අපි ඒක කර ගෙන යනවා. ගිය මාසෙත් පත්වීම් වගයක් දුන්නා. දැන් ඊයෙ කැබිනට් මණ්ඩල රැස්වීමේ තීරණය කළා තව කෘෂිකාර්මික උපදේශකයින් 500 ක් ගන්න ඕනා කියලා. ලබන මාසෙ වෙන කොට තවත් 800 ක් බඳවා ගන්නවා. ක්ෂේත්‍රයට, ව්‍යාප්තියට අවශ්‍ය නිලධාරීන් .

ඊළඟට ගොවියාට නිෂ්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සපයා දෙන්න ඕනා. අපි හැමදාම කලේ ගොවියා පිට සේරම පටවලා බලා ඉන්න එක. ගොවියාම තමන්ගේ කාර්යයන් කර ගන්න ඕනයි කියල, අපි මෙතෙක් හිතුවෙ. වතුර ටික ලබා ගන්න, ඇල හද ගන්න, ණය ටික කොහෙන් හරි හොයා ගන්න, බිත්තර වී ටික හොයා ගන්න එක ගොවියා ලවාම කරවන්න. ඇල කැපීම සුමානයක් ප්‍රමාද කලොත් බතින්නෙ ගොවියාට. ණය ගෙවීම ප්‍රමාද කලොත් බතින්නේ ගොවියාට. තමුසෙ, වෙලාවට බැංකුවට ගියෙ නැහැ කියලා. බිත්තර වී නැති වුනොත් ගොවියාට බනිනවා, වෙලාවට වගා කළේ නැහැ කියලා. හය මාසයකට ඉස්සර ඕඩර් කරන්න ඕනා දැන් අපට කරන්න දෙයක් නැහැ කියලා. නිදහසට නම් කරුණු ඕනෑ තරම් තියෙනවා. ගොවියා පිට ඔක්කොම පැටෙව්වම. මගේ කල්පනාව නම් මේ සැරේ ගොවියාට ඔක්කොම දෙන්න. උදැල්ලෙ ඉඳලා බිත්තර වී, පොහොර, කෘමිනාශක වැනි දේවල්. ඒවනෙ ගොවියාට අත්‍යවශ්‍යම දේවල්. ගොවිජන සේවා මධ්‍යස්ථාන මාර්ගයෙන් මහ කන්නයේ ඉඳලා ඔක්කෝම දේවල් ගොවියාට දෙනවා. මේවා දෙන්නෙ ණයට; ගොවියාට ඕන නම් සල්ලි වලට ගන්නත් පුළුවන්. මේ ක්‍රමය හරි ගැස්සුවහොත් මම හිතනවා මහ කන්නෙ ඉඳලා ගොවියා හැම බිම් අඟලක්ම වගා කරයි කියලා. මෙතන තවත් භයානක ප්‍රශ්ණයක් තියෙනවා, මොකද? පසුගිය අවුරුද්දෙ හෙක්ටයාර් එක් ලක්ෂ අටදහක් වග කරලා නැහැ. ඇයි, එහෙම වුනේ. සමහර ඒවා නම්, උතුරු නැගෙනහිර ප්‍රශ්නෙ නිසා වෙන්න පුළුවන්. ඒත් අනික් තැන්වල වගා කරලා නැත්තේ එතන මොකක් හරි ගැටලුවක් තියෙනවා. අපි ඒක හොයන්න ඕන. ඒක හොයන්න ඉස්සෙල්ලා මම හදන්නේ වගා කළ හැකි හැම ඉඩමක්ම වගා කරන්න, ගොවියා උනන්දු කරවන්න. පොහොර වැඩියෙන් දුන්නම ගොවියාට පුළුවන් වෙයි, එක අක්කරයකින් තව බුසල් 5 ක් වත් වැඩිය ලබා ගන්න.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමණි, 1994 වර්ෂය සඳහා වී බුසල් දශ ලක්ෂ 150 ක් පමණ අවශ්‍ය වෙනවා. අප පාරිභෝජනය සඳහා වී බුසල් දශ ලක්ෂ 130 ක් පමණ වසරකට අවශ්‍ය වෙනවා. බිත්තර වී වලටත් අයින් කරන්න වෙනවා. දශ ලක්ෂ 04 ක් විතර ; ඉතිරිය අපතේ යාම වෙනුවෙන්.

**පිළිතුර :-**

ඔය බිත්තර වී අවශ්‍යතාවයෙන් 80% ක් පමණ වී නිෂ්පාදන සංඛ්‍යා ලේඛන වලට අයත් වෙලා නැහැ. ගොවියො වී බුසල් 4 හරි, 08 හරි අස්වැන්නෙන් බීජ වී වලට අයින් කරලා තමයි ඔය ගණන් හිලව් පෙන්වන්නේ. ඒ නිසා ඒ ගැන බයක් වෙන්න අවශ්‍යතාවයක් නැහැ. දැනට අපතේ යෑම සිදු වන්නේ 14% යි. ඒක 10% කට බස්සා ගත්තොත් බොහොම හොඳයි. ඒකෙන් කෙටීමේ දී වන අපතේ යෑම් වෙන් කලාම පරිභෝජනය සඳහා වී බුසල් 130 ක් හොඳටම ප්‍රමාණවත්. ඒ මට තිබෙන සංඛ්‍යා ලේඛන අනුව. ඒක වැරදි නම් කරුණාකරලා මට කියන්න.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමණි, මෙහි දී බිත්තර වී පිළිබඳ ප්‍රශ්නයක් ඇතිවෙනවා නේ ද?

**පිළිතුර :-**

ඔව්; බිත්තර වී ප්‍රශ්ණයක් තිබුණා. මම හිතන්නේ ඉදිරියේ දී එහෙම ගැටළුවක් පැන නගින එකක් නැහැ. මොක ද? අපි දැනට බිත්තර වී සපයන්න හුඟාක් පුද්ගලයින් ලියා පදිංචි කලා. ඒ වී වලට සහතිකයක් ලබා දෙනවා. මම ඒවා මගේ ආයතන මගින් මිලයට ගන්නවා. මොකද? දැන් ලබන කන්නෙ වන විට බිත්තර වී සැහෙන ප්‍රමාණයක් වැඩියෙන් අවශ්‍ය වෙනවා. අපි අර සහතිකය දෙනවා දෙපාර්තමේන්තුවට ඒ බිත්තර වී වල තත්ත්වය හොඳයි කියලා. ඊට පස්සේ දෙපාර්තමේන්තුවෙ සහතිකය උඩ ඒ බිත්තර වී ගොවි ජනසේවා දෙපාර්තමේන්තුව මගින් මිළ දී ගන්නවා. අපේ මධ්‍යස්ථාන වලට උවමනා කරන බිත්තර වී ටික, මම හිතන්නෙ අපට අවශ්‍ය වෙන්නෙ දළ වශයෙන් බිත්තර වී බුසල් දශ ලක්ෂ 04 යි. ඒත් මම හිතනවා එම ප්‍රමාණයම දශ ලක්ෂ 10 දක්වා ඉහළ යයි කියලා. මොකද බිත්තර වී අපි ණයට දෙන්න පටන් ගත්තම ගොවියො සේරම තමන්ගේ බිත්තර වී අවුරුදු එකකින් හෝ දෙකකින් මාරු කරන්න පටන් ගනීවි. ඒ නිසා බිත්තර වී වැඩි ප්‍රමාණයක් ඕන වේවි.

**ප්‍රශ්නය :-**

අපි දන්න හැටියට නම් පසුගිය අවුරුදු කීපය තුළ සාමාන්‍ය අස්වැන්න ඉහළ ගිහිල්ල නැත්තෙ බිත්තර වී ප්‍රශ්නෙ නිසා, ඒ කියන්නෙ බිත්තර වී වල තිබිය යුතු ගුණාත්මක තත්ත්වය පහළ ගිහිල්ලා තියෙනවා.

**පිළිතුර**

දැන් ඉතින් මේක ඒකට පිළියමක් වේවි මොකද බොහෝ විට බිත්තර වී ගන්න ගොවීන්ට මුදල් නැහැ. ඒ නිසා ගෙදර තිබෙන පැල වීමේ හැකියාව අඩු බීජ ගොවියො පාවිච්චියට ගන්නවා . ඒකයි මම මුලින්ම කිව්වේ අපිට ලක්ෂ 4 ක් අවශ්‍ය වෙනවා කියලා. භාණ්ඩාගාරයෙන් මට අවසර දීලා තියෙන්නෙ බුසල් පනස් දාහක් නිපදවන්න අවශ්‍ය මුදල් පමණයි. ඒත් මම ලක්ෂ 10 ක් බෙදා හරින්න හදනවා. මම මේක පලාත් සභා වලට භාර දීලා තියෙනවා. ඒ ගොල්ලොත් මහන්සි අරගෙන දැන් එක්තරා මට්ටමකට ගෙනැල්ල තියෙනවා, දිස්ත්‍රික්ක මට්ටමෙන් බිත්තර වී නිපදවන්න. ඒක හින්දා සමහර තැන් වලට දැන් අපි බිත්තර වී සපයන්න අවශ්‍ය නැහැ. පළාත් සභා මගිනුත් සපයනවා. දෙපාර්තමේන්තුව ලක්ෂ 4 ක් ඉලක්ක කළාට මම ලක්ෂ 10 ක් නිපදවනවා ණයට දෙන නිසා ඒවා විකුණා ගන්නත් අපහසුවක් වෙන එකක් නැහැ. මෙතෙක් කල් කලේ අවු.: හතර, පහේ එකම බිත්තර වී මාරු කර කර වගා කරන එක. අපි ඒක නතර කරන්න ඕනා. ලබන කන්නයේ ඉඳලා මිරිස් සම්බන්ධයෙනුත් අපි ඔය පියවර ගන්නවා. එතකොට අක්කර 10,000 ක් අළුතින් මිරිස් වගා කරනවයි කියන එක ප්‍රශ්ණයක් වෙන්නෙ නැහැ.

**ප්‍රශ්නය :-**

එළවළු වලටත් ඔය බීජ ප්‍රශ්නෙ තියෙනවා පුද්ගලික අංශයට ආනයනය

කරන්න ඉඩ දීලා තියෙන නිසා බාල තත්ත්වයේ ඒවාත් වෙළඳ පොළට ගෙනවිත් තියෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්. එක්කෝ දෙපාර්තමේන්තුව මාර්ගයෙන් හෝ නැත්නම් ගොවි සංවිධාන මාර්ගයෙන් දෙපාර්තමේන්තු උපදෙස් අනුව එළවළු ඇට බෙදා දීම කළ යුතු වෙනවා.

**පිළිතුර** :-

දැන් බීජ අල වලට අවසර දෙන කොට මම කියලා තියෙනවා මගේ නිලධාරීනුත් එක්ක ගිහිල්ලා ඒවා තෝරන්න කියලා. ඒවා හරියට අසුරලා, ඒවා නැවට පටවලා තමයි, මගේ නිලධාරීන් ආපසු එන්නෙ. නැතුව, ඒගොල්ලන්ට නිකම් "පර්මිට්" එකක් දීලා ඕන අලයක් ගෙන්න කියලා බලං ඉන්නෙ නැහැ. මොකද එතැන හරියට නිවැරදි කර ගත්තොත් ප්‍රශ්ණයක් නැහැ. ගිය සැරේ මම ගොවි සංවිධාන වලට අවසර දුන්නා බීජ එළුණු ගේන්න කියලා. ඒත් ඒගොල්ලො ඒක බාර ගත්තෙ නැහැ. බයක් තිබුණා. මේ සැරෙත් මම අවසර දීලා තියෙනවා. මේක අවදානම් වැඩක් හින්දා මේවට ආයෝජනය කරන්න මිනිසුන් බයයි. මේවා දියුණු කරන්න බයේ ඉඳගෙන බැහැ. අත දිග ඇරලා වියදම් කරන්න ඕනා. මගේ ලොකු විශ්වාසයක් තියෙනවා මේක අසාර්ථක වෙන්නෙ නැහැ කියලා.

**ප්‍රශ්නය** :-

දැන් ඇමති තුමනි, ඔබ තුමා කියපු ආකාරයට පෙනී යනවා අපේ නිෂ්පාදනය වැඩි කරන්න යම් කිසි පැහැදිලි වැඩ පිළිවෙලක් තියෙනවා කියලා. මෙතනදී ගොවීන්ට ලොකු වගකීමක් පැවරෙනවා. ගොවි සංවිධාන වලටත් යෙදවුම් ලබා ගැනීම හා ඒවා බෙදා හැරීම සම්බන්ධයෙන් ලොකු කාර්යභාරයක් පැවරෙනවා. කොහොමද ගොවි සංවිධාන යොදා ගන්නෙ මේ කාර්යය සාර්ථකව ඉටු කර ගන්න.

**පිළිතුර** :-

සංවිධානෙකින් තොරව තනි තනිව ගිහිල්ලා මේ කාර්ය කරන්න අමාරුයි. මේ සේරම අපි ලබා දෙන්නෙ ගොවි ජන සේවා මධ්‍යස්ථාන වලට. එතකොට ගොවිජන සේවා මධ්‍යස්ථාන යටතේ තිබෙනවා ගොවි සංවිධාන 20 ක් 30 ක් විතර. ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ඒවා ඒ ගොවි සංවිධාන වලට බෙදා දෙනවා. සංවිධානය තමයි, පුද්ගලයින්ට ණය ලබා දෙන්නෙ. ගොවි කාරක සභාව රැස් වෙලා තීරණය කරනවා ණය කාටද දෙන්නෙ කියලා. ණය ලබා ගන්න නම් අනිවාර්යයෙන්ම ගොවියෙක් වෙන්නම ඕනා. එක එක ගොවියාට අක්කර කියක් අයිතිද කියලා ගොවි සංවිධාන ලේඛණයේ සටහන් වෙලා තියෙනවා. ණය ලබන්න ගොවියෙක් වුනාටම මදි. ගොවි සංවිධානෙ සාමාජිකයෙකුත් වෙන්න ඕනා. ඒවා බලලා තමයි ඒ ගොල්ලො තීරණය කරන්නෙ ණය දිය යුතු ප්‍රමාණය. ඒක එච්චර අමාරු වැඩක් නොවෙයි. අපි අක්කරයකට දෙන නියමිත යෙදවුම් ප්‍රමාණයක් තිබෙනවා. එතකොට අපි ඒ ප්‍රමාණය සේරම එකතු කරලා බලල ගොවිජන සේවා මධ්‍යස්ථානයට ගෙනල්ල දෙනවා. එතකොට ගොවි සංවිධාන තමයි, වග කියන්නෙ, ණය දෙන්නෙත්, ණය ආපසු අය කර ගන්නෙත්. එහෙම ණය අය කර ගෙන ඒවා මධ්‍යස්ථානයට ගෙනල්ල දෙන්න ඕන. මධ්‍යස්ථානය මගින් ඒ ඒ අදාල ආයතන වලට අය විය යුතු මුදල් ගෙවීම කරනවා. මේ ක්‍රමයට තාම මිනිස්සු පුරුදු නැති නිසා මුලදී ටිකක් අමාරු වෙයි. දැන් අපි මේ සදහා ප්‍රාදේශීය නිලධාරීන් පුහුණු කර ගෙන යනවා. මොකද එයාගෙ අතේ තමයි, වගකීම සම්පූර්ණයෙන් ම රදා පවතින්නෙ. ඒ ගොල්ලන්ගෙත් 170 ක විතර අඩුවක් තිබුනා. අපි ඒ ඔක්කොම දැන් පුරවනවා: දැන් බලන්න, මේ වැඩ කරන්න තියෙන මධ්‍යස්ථානෙ ඉන්නවා ලිපිකරුවෙක්. එයා රජයේ සේවකයෙක් නොවන නිසා හරියට වැඩ කෙරෙන්නෙ නැහැ. එහෙම වුනොත් මම දන්නවා මේ වැඩ පිළිවෙල අසාර්ථක වෙනවා කියලා . දැන් ඒ ගොල්ලවත් රජයේ සේවකයන් හැටියට බඳවා ගැනිමට රජය් කටයුතු කරගෙන යනවා. මම ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාවක් අනුව, මේ මහ කන්නයට ඉස්සර ඒ අයව ස්ථිර කරනවා. ඊට පස්සේ රජයේ සේවකයෙක් නිසා උනන්දුවෙන් වැඩ ටික කරයි. මම බලාපොරොත්තු වෙනවා මේ වැඩ පිළවෙල වල් මගින් මධ්‍යස්ථාන ටික හරිගස්සන්න මේ මධ්‍යස්ථාන යටතේ ගොවි කාරක සභාවකුත්, තියෙනවා ඒ ගොල්ලොත් දැනුවත් කරන්න ඕන. සමහර වෙලාවට මේකට අවුරුද්දක් දෙකක් යයි. සමහර තැන්වල නම් එච්චර කාලයක් යන්නෙ නැහැ. ලබන මාස් කන්නය වෙන කොට ඒ කියන්නෙ 94 / 95 දි තමයි අපට තියෙන්නෙ ලොකුම යුද්ධය කරන්න. එතනදී මම බලාපොරොත්තු වෙනවා මිනිසුන්ට ණය දෙන්න. අත් ට්‍රැක්ටර් 5000 ක් බෙදලා දෙන්න. ලොකු ට්‍රැක්ටර් 1000 ක් දෙන්න ලංකාවටම. ඒවා මදි උනොත් අලුතින් ගෙනල්ලා දෙනවා. ඒ ඔක්කොම දෙන්නෙ මධ්‍යස්ථාන වලට. අඩු ගාණකට හාලා දෙනවා, සී සෑම කරලා ඒ වෙලාවෙ ගොවියාට සල්ලි දෙන්න නැත්නම් මාස 4 කට පස්සෙ ඒ කියන්නෙ අස්වැන්න නෙළුවට පස්සෙ පුළුවන් සල්ලි දෙන්න. ගොවි සංවිධාන වලට දෙනවා, අත් ට්‍රැක්ටර්, ගොයම් මඩින යන්ත්‍ර. ගොවිජන සේවා මධ්‍යස්ථානයට අවශ්‍ය නම් එතනටත් කොළ මඩින යන්ත්‍රයක් අරගෙන දෙනවා. මොකද මට ඕන වෙලා තියෙනවා ශක්තිමත් අංග සම්පූර්ණ ගොවිජන සේවා මධ්‍යස්ථාන හදා ගන්න . 1995 ජනවාරි වල ඉඳලා හාල් පිටරටින් ගෙන් වීම නවත්වන්න හදනවා . ඉතින් ඒකට අවශ්‍ය වටපිටාවක් අපි හදා ගන්න ඕනා.

**ප්‍රශ්නය** :-

ඇමතිතුමනි, කොළ මඩින යන්ත්‍ර බෙදා හැරීම හුගාක් වැදගත්. මොකද ඒවායින් කොළ මඩින කොට වී වල ගුණාත්මක තත්ත්වය ඉහළ යනවා. ඒ හින්දා අපිට වැඩි වැඩියෙන් ඒ යන්ත්‍ර අවශ්‍ය කරනවා.

**පිළිතුර** :-

ඔව්, කොළ මඩින යන්ත්‍ර ඕනෑ නම් 1000 ක්, ලංකාවේ තියෙන්නෙ 100 ක් නම්, අනික් 900 අපි පිටරටින් ගෙන්වනවා. අන්න එතකොට තමයි මම ඉඩ දෙන්නෙ පිටරටින් ආනයනය කරන්න. අපිට අඩුවක් තියෙනවා නම් අපි ඒ වගේ දේවල් පිටරටින් ආනයනය කරනවා. අපි කලින් කිව්වා වී වල ගුණාත්මක තත්ත්වය ගැන, අපි ගොවි සංවිධාන මාර්ගයෙන් ගොවියා දැනුවත් කරන්න ඕනා. නිති රීති දැම්මොත් ඒක කරන්න අපහසුයි. ගොවීන්ට මීට පස්සෙ ට්‍රැක්ටර් නිකං කමතෙ දාලා ගොයම් පාගන්න ඉඩ දෙන්නෙ නැහැ. මම, කාලයකදී ඒක තහනම් කරන්න ඉන්නෙ. ඒත් ඊට ඉස්සෙල්ලා ගොවියා මේකට දැනුවත් කරන්න ඕනා. මම දෙනවා ගොවි සංවිධාන වලට ණයට පඩංගු කීපයක් කොළ මඩින්න ගන්න. අපිට ඒ වගේ පඩංගු 4000 ක් 5000 ක් අවශ්‍ය වෙයි. මම තවත් බලාපොරොත්තු එක දෙයක් තමයි, වී නාස්තිය වැළැක්වීම. අනිත් එක වී වලට ගල් වගේ අනවශ්‍ය දේවල් එකතු වීම නැවැත්වීම . මම දැන් ඒක පටන් අරගෙන තියෙන්නෙ. මම ගොවි සංවිධාන වලට උපදෙස් දිලා තියෙනවා, ඒ පඩංගු හදා ගන්න කියලා. සල්ලි නැත්නම් මම ඒකට මුදල් ලබා දෙනවා.

**ප්‍රශ්නය** :-

දැනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ මේ ක්‍රමය ක්‍රියාත්මක වෙනවා නේ ද ඇමති තුමනි, මේ නිසා වී වලට වැඩිම මිලක් ලැබෙන්නෙත් එම දිස්ත්‍රික්කයේ යි. මොකද ඒ වී ගුණාත්මක තත්ත්වයෙන් ඉහළයි.

**පිළිතුර** :-

හැම තැනම තියෙනවා. ඒත් මේකයි වෙලා තියෙන්නෙ. මේක අවශ්‍ය බව ගොවීන් දැන ගත්තත් ඒවා සපයා ගන්න ඒ ගොවීන් ළග මුදල් නැහැ. ඒකයි මම කිව්වේ, ගොවිජන සේවා මධ්‍යස්ථානෙ මේවා සේරම තියෙන්න ඕන කියලා. එක පඩංගුවකින් රුපියල් 10 ක් අය කරාම ඉවරනෙ. ඔ ගොල්ලොත් ඒ තැන් වලට ගියාම මේකට ප්‍රචාරයක් දෙන්න. මේ විදිහට කරන්න කියලා . එතකොට මෝල් කාරයාට කියන්න බැහැ අපේ ගොවියා ගලුත් එක්ක වී දෙනවා

කියලා. අනිත් එක කොළ මඩින යන්ත්‍ර පාවිච්චි කළාම ගල් කළවං වෙන්නෙ නෑ කොහොමදීවත්.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමනි, නිෂ්පාදනයේ දී ලබන මිල මෙතනදී ඉතාමත් වැදගත් වෙනවා නේද ? ඒ සම්බන්ධයෙන් මොකද්ද අපේ ක්‍රියාත්මක වැඩ පිළිවෙල? වී සහ අතිරේක භෝග වලට රජයේ දැනට තියෙනවා සහතික මිළ සහ අවම මිළ ක්‍රමය. උදා :- වශයෙන් වී අලෙවි මණ්ඩලය; එය වී සම්බන්ධයෙන් සහතික මිල ක්‍රියාත්මක කරන්න ආයතනයක්. ඒත් අනිත් බෝග වලට පැහැදිලි ආයතනයක් තවම ක්‍රියාත්මක කළේ නැහැ. ඒ අනෙක් බෝග මිලයට ගන්නට වී අලෙවි මණ්ඩලය සහ ස.තො.ස ඉදිරිපත් වුනාට එහි ඒ තරම්ම ක්‍රියාත්මක භාවයක් දකින්නෙ නැහැ . ඒ සම්බන්ධයෙන් මොකක් හරි වැඩ පිළිවෙලක් තියෙනවා ද ?

**පිළිතුර :-**

ඒක මට අයිති විෂයයක් නොවෙයි. මට පැවරිලා තියෙන්නෙ නිෂ්පාදනය. අලෙවිය මට සම්බන්ධ නැහැ. මම අලෙවියට බැස්සොත් මේ කර ගෙන යන වැඩ පිළිවෙල තවත් අමාරු වෙනවා. නමුත් දැන් ජේන හැටියට අපිට සිද්ධ වෙලා තියෙනවා ඒකටත් මැදිහත් වෙන්න. මොකද මේ සැරේ ළූණු වලට ඔය ප්‍රශ්නය ආව. ළූණු ගැන පත්තර වල තියෙන විස්තර ගැන විශ්වාස කරන්න එපා. ඒ ගොල්ලන්ට පෙනිලා ගිහිල්ලා නැහැ ටොන් 30,000 ක් මේ රටේ ගොවියා නිෂ්පාදනය කලා කියලා. හැමදාම බනිනවා ඇරෙන්න ඒක කොහොමද කළේ. මේක නිෂ්පාදනය කළේ කොහොමද ? මේවා මෙතන්ට ගෙනාවේ කොහොමද, කියන එක ඒ ගොල්ලන්ට පෙනිලා නැහැ. දැන් රතු ළූණු ගෙඩියක් වත් මම පිටරටින් ගෙන්වන්න දෙන්නෙ නැහැ. ඔක්කොම අපි නිෂ්පාදනය කරනවා. අඩුගානෙ එහෙම ලියන අයට වටිනවා නේද මේකෙ හොඳ පැත්ත රටට පෙන්නලා දෙන්න, ස.තො.ස. කියන්නෙ එක ආයතනයක්. ඒගොල්ලන්ට බැහැ විශාල ප්‍රමාණයක් මිලයට ගන්න. මට ජේන හැටියට ටොන් 8000 කට වැඩිය ගන්න අමාරුයි. උදේට ගොවියාට කියනවා "අපි මිලදී ගන්නෙ නැහැ" කියල. හවසට ගිහිල්ල වෙළෙන්දගෙන් ගන්නවා .එහෙම කරලා කියනවා ගොවියාගේ ළූණු තත්ත්වයෙන් බාලයි කියලා. මේ සැරේ මම කියලා තියෙනවා ළූණු ටික ලංකාව පුරාම බෙදා හරින්න කියලා. සමුපකාරය, මාක්පෙඩ්, දිස්ත්‍රික් ගොවි සංවිධාන, ආදී ආයතන මාර්ගයෙන්.

අපි ඒ ගොල්ලන්ට කියලා තියෙනවා "අපි ලොරි දෙන්නම්" - ඇවිල්ල අඩු වශයෙන් ලොරි දෙක තුනක් වත් තමන්ගෙ කොට්ඨාශ වලට ගෙනියන්න කියලා. අරගෙන ගිහිල්ලා ඒවා විකුණලා නැවත එන්න කියලා. මාස 2 - 3 ක් මේකට යනවනෙ. එතකොට මෙතන තියෙන තදබදය ටිකක් මග හැරෙයි. ගිය සැරේ ඔක්කොම ස.තො.ස.ට පැටෙව්වා. පුද්ගලික වෙළෙන්දා කවදාවත්ම එන්නෙ නැහැ ගොවියා ළගට. ඒ ගොල්ලො බලා ඉඳලා මිල පහතටම වැටුනු වෙලාවට ගිහිල්ලා ගන්නවා. ඒකයි ඒ ගොල්ලන්ගේ සිරිත. ඒ නිසා ආණ්ඩුවේ යම් යම් ආයතන මේවට ඉදිරිපත් වෙන්න ඕනා. අපි සමුපකාර වලට නියෝගයක් යවලා තියෙනවා, හැම සමුපකාරයක් ම අල, ළූණු නිෂ්පාදකයාගෙන් මිලයට ගන්න ඕනා කියලා. මේ රටේ සමුපකාර 300 ගණනක් තියෙනවා . ඒවායින් 200 කට සතියකට ලෝඩ් 200 ක්, "ලෝඩ් 200 ක් කියන්නෙ - ටොන් 2000 යි". එක සමුපකාරයකට ලෝඩ් එකක් යවනවයි කියන එක ඒ තරම් අමාරු වැඩක් නොවෙයි. ඒ ගොල්ලන්ට මුදල් නැත්නම් බැංකු වලින් මුදල් දෙන්න පියවර ගන්නවා. නැත්නම් සමුපකාර අරමුදලින් ලබා දෙනවා. මේ වැඩ වලදී ක්‍රමානුකූලව ටික ටික ඉදිරියට යනවා ඇරෙන්න අමාත්‍යාංශයක් හැටියට එක පාරටම ඔක්කොම දේවල් කරන්න අමාරුයි. මම විශ්වාස කරන හැටියට මේ සැරේ එක පාරටම වෙළඳ පොලට එන්නෙ නැහැ. ගොවි සංවිධානවලට ස්තුති වෙන්න ගොවියො දැන් කථා වෙනවා, අද මිළ රු. 15 ක් තියෙන්න ඕනා, නැත්නම් අපි විකුණන්නෙ නැහැ, ඉල්ලන්නෙ රු. 10 ක් නම් අපි දෙන්නෙ නැහැ. විසි කරලා දානවා කියලා. ගොවියා දැන් ඒ තත්ත්වයට ගොඩ නගලා තියෙනවා. අපි ගොවියො 600 ක් මුන ගැහිලා ඒ තීරණයට බැස්සා. හොඳට මෝරලා ගැලෙව්වම මාස දෙක තුනක් තියා ගන්න පුළුවන්. ඒ නිසා මිළ ඉහළ නගින තෙක් ඉන්න පුළුවන්.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමනි, මේ සඳහා ගොවියා ගබඩා කිරීම කෙරෙහි උනන්දු කළ යුතුයි නේද?

**පිළිතුර :-**

ඇත්ත, ඒක තමයි කළ යුත්තෙ, මොකද ලොකු ළූණු කියන එක හැමදාම හදන්න බැහැ. අලත් එහෙමයි. එක් එක් කාලයට හදන්න පුළුවන් ප්‍රදේශ තියෙනවා. නුවරඑළියෙ එක් කාලයක්, වැලිමඩ තවත් කාලයක්, අනිත් තැන් වල තවත් කාලයක්. ඒ වාගේ එක එක කොට්ඨාශ වල වෙනස්කම් තියෙනවා. දැන් ළූණුත් ඒ විදියට අපි ව්‍යාප්ත කර ගෙන යනවා, දැන් ගිය සැරේ නොවැම්බර් වල ළූණු වැව්වා. ඒ තරම්ම සාර්ථක නැහැ .මේ අවුරුද්දෙත් මම කිව්වා වවන්න කියලා. පාඩුවක් වින්දට කමක් නැහැ. දැන් ජනවාරි මාසෙත් ළූණු වවනවා. අපි තෝරා ගෙන තියෙනවා පොළොන්නරුව, කුරුණෑගල, හම්බන්තොට, මොණරාගල ජනවාරි වලට වවන්න. ඒ මාසෙ අපට පුළුවන් වුනොත් අක්කර 1000 ක් 1500 ක් වවා ගන්න මේ ප්‍රශ්නෙ හුගාක් දුරට විසඳෙනවා.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමනි, මම අවධාරනය කරන්න ගත්තෙ ගබඩා කිරීමේ පහසුකම් සඳහා දෙන ණය පිළිබඳව. දැනට වෙළෙන්දන්ට බැංකුව ලබා දෙනවා, උදා :-වශයෙන් පොළොන්නරුවෙ එක බැංකුවක් දීලා තියෙනවා ලක්ෂ 80 ක් , එක වෙළෙන්දෙකුට වී ගබඩා කරන්න. ඒ වගේ ගොවි සංවිධාන වලටත් පුළුවන් නම් එවැනි ණය ලබා දෙන්න එය වඩාත් ප්‍රයෝජනවත් නේද? මොකද දැනට මේකෙන් ලාභ ගන්නෙ වෙළෙන්දො නිසා.

**පිළිතුර :-**

ඔය ගබඩා කරන මෝල් කාරයො, මේ ආයතනයට ආව මාව හම්බ වෙන්න. ඒ ගොල්ලො කියනවා, ඒ ගොල්ලන්ටත් මේක ගෙනියන්න අපහසුයි කියලා. ඒකෙත් එක්තරා ඇත්තක් තියෙනවා. මෙතෙක් කල් ඒ ගොල්ලො රැකුනෙ වී අලෙවි මණ්ඩලය නිසා. වී අලෙවි මණ්ඩලය කොටා දෙනවා ඒ ගොල්ලන්ට. ඒ ගොල්ලන් වී කොටලා ආහාර පාලකට දෙනවා. ඉතින් ඔය ක්‍රමය හොඳට තහවුරු වෙලා තිබුණා. මේ ක්‍රමය දැන් නැති වුණා. මේ ක්‍රමය නැති උනාම රටේ ලොකු විප්ලවයක් උනා. මොකද ? පොඩි මෝල් කාරයො ශක්තිමත් වුනා. ලොකු මෝල් අයිතිකාරයින්ට මෝලේ හැටියට බුසල් 50,000 ක් වත් ගත්තෙ නැත්නම් පාඩුයි. දැන් අපිට කියනවා නොයෙකුත් පහසුකම් දෙන්න කියලා. නොදීත් බැහැ. මොකද? වී කොච්චර නිෂ්පාදනය කලත්, ඒවා සහල් බවට පත් කරන ඒකකය හදා ගත්තෙ නැත්නම් ඒකෙන් වැඩක් නැහැ. මිනිසුන් යම් යම් වැරදි කලාට දැන් කැමතියි ඒක හරි ගස්ස ගන්න. ඉතින් මම කීවා නවීකරණය කරන්න ආධාර කරන්නම් කියලා. ණය දෙන්නම්, යන්ත්‍ර පිටරටින් ගෙන්වලා දෙන්නම්. ඔක්කොම මෝල්ටික නවීකරණය කරන්න කියලා. ලබන මහ කන්නෙට ඒ කියන්නෙ 95 ජනවාරි මාසෙට ඉස්සෙල්ලා සූදානම් වෙලා ඉන්න ඕනා. මේ අයත් අයින් කරන්න හොඳ නැහැ. දැන් ඔබේ ප්‍රශ්නෙට උත්තරයක් දෙනවා නම් වී අලෙවි මණ්ඩලයට අපි උපදෙස් දීලා තියෙනවා අපි කියන මිලටම ගන්න කියලා. අනිත් එක වී මිල ගැන රටේ ඒ තරම්ම ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්නෙ තියෙන්නෙ අනිත් ඒවට එළවළු, ළූණු වගේ දේවල් වලට. වී වල ආරක්ෂිත මිල ගොවියෝ හොඳට දන්නවා. අනිත් එක වී ඉක්මණට නරක් වෙන දෙයක් නෙවෙයි නෙ.

**සාකච්චා කළේ**
**එල්.පී. රූපසෙන**
**ඩබ්ලිව්. ඒ. ජයරත්න**